දෙවන වාර පරීක්ෂණය - 2011

මාරිස් ස්ටෙල්ලා විදුහල - මීගමුව

| 11ශ්‍රේණිය | නර්තනය | කාලය පැය යි |
|---|---|---|

නම :......................................................... ශ්‍රේණිය :....................... අංකය :.......................

උපදෙස් -
ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

**I කොටස**

1) ගොඩ සරඹ 8 වෙනි හරඹයට කියන නාමය ලෙස සැලකෙන්නේ
   - I. චන්ද්‍රිකා හරඹය
   - II. අර්ධ චක්‍රය
   - III. ඇල හරඹය
   - IV. දෑල හරඹය

2) සැවුලා වන්නමට අදාල කස්තිරමේ කොටසකි
   - I. කුද ගජිත කුද තා
   - II. කුද ගජිගත කුද තා
   - III. රුංත ගජිංගත ජිංගත කුන්දත්
   - IV. රුද ගත ගත ගත කුන්දත්

3) "කුදාංත ගත දොම්" වට්ටමට අදාල තාල රූපය ලෙස සැලකෙන්නේ ,
   - I. 2+2 +4
   - II. 2+2+3
   - III. 2+4
   - IV. 3+3

4) මාත්‍රා තුනේ තාලයට අයත් වට්ටමකි
   - I. කුදංත ගත දොම් වට්ටම
   - II. කුදකුජිගත වට්ටම
   - III. දෙංජිංත ගතදොංත වට්ටම
   - IV. ගොග් ගොග් ජිංගත වට්ටම

5) රති නම් ස්ථායිභාවයට පාදක වන රසය ලෙස හැඳින්වෙන්නේ
   - I. හාස්‍ය රසය
   - II. කරුණා රසය
   - III. වීර රසය
   - IV. ශෘංගාර රසය

6) භායානක රසයට පාදක වන ස්ථායි භාවය ලෙස නම් කෙරෙන්නේ,
   - I. භය
   - II. රති
   - III. අත්භූත
   - IV. ශාන්ත

7) රස භාව ක්‍රියාවලිය වැඩි වශයෙන් භාවිතාවන නර්තන සම්ප්‍රදායකි .
   - I. උඩරට නර්තන සම්ප්‍රදාය
   - II. සබරගමු සම්ප්‍රදාය
   - III. පහතරට සම්ප්‍රදාය
   - IV. ජන නැටුම් සම්ප්‍රදාය

8) අවකාශ භාවිතයේදි භාවිතාවන නියමිත දිසා සංඛ්‍යාව වන්නේ ,
   - I. 8
   - II. 10
   - III. 9
   - IV. 12

9) දොං දොං ජිං ජිං ගජිගත මෙම බෙර පදය අයත් තාල රූපය වන්නේ
   - I. 2+3
   - II. 2+4
   - III. 3+4
   - IV. 4+4

10) “වන් නිල්ගෙල නිල්රල් වරලින් බිගුදැල්ලා” මෙම කවි පදය ප්‍රස්ථාර කල හැකි කාල රූපයකි

I. 2+3 II. 3+4 III. 2+4
IV. 3+3

11) තාලය හා රිද්හය යන දෙකම බොහෝ දුරට අන්තර්ගත ගායනා විශේෂයකි

I. රබන් කවි III. පතල් කවි
II. ටීකා කවි IV. වන්නම්

12) ග්‍රහපන්ති ගායනාවලට අයත් කවියක කොටසකි

I. සොබමන් දෙව්වරු සදෙනෙත් එතැනට
II. සිරිවස ගෙන අසු නැගෙමින් නොලසා
III. සිහින් සිනිඳු සළුව පැලඳ විත් උන් මරගන
IV. මිහින්තලය අටසැට ලෙන සේල චෛත්‍ය වෙහෙරට

13) “ කලුවන් කලු රුවයි මංගෝ දිලිසෙනවා”යන ජන ගායනය අයත් වන ගායන විශේෂයකි

I. පැල් කවි III. පතල් කවි
II. පාරු කවි IV. පන් නෙලීමේ කවි

14) උඩැක්කියේ දිග ප්‍රමාණය නියමිත වරණය වන්නේ

I. වියත් දෙකකි III. වියත් හතරකි
II. එක් වියත් තුනගලකි IV. වියත් තුනකි

15) දේශිය බෙර වර්ග සෑදිමට වැඩි වශයෙන් යොදා ගන්නා දැව වර්ග දෙකකි

I. ඇහැල ලී සහ කොස් ලී III. ඇහැල ලී සහ නඳුන් ලී
II. අඹ ලී සහ තේක්ක ලී IV. තේක්ක ලී සහ ඇහැල ල

16) මහනුවර යුගයේ නර්තනයට අනුග්‍රහ දැක්වු ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසංහ රජුගේ කාලවකවානුව වන්නේ ,.

I. 1591 -1604 කාලය III. 1707 - 1739 කාලය
II. 1636 - 1686 කාලය IV. 1815 - 1900 කාලය

17) 1591 ලංකාවට පැමිණ මහනුවර පෙරහැරේ තරුණියන් ලස්සනට නටන බව ලියා තිබු දේශාඨන වාර්තා කරුවා ලෙෂ හැඳින්වෙන්නේ

I. රොබට් නොක්ස් III. ස්පිල් බර්ජන්
II. ජෝන් ඩයිලි IV. සොල්බරි සාමි

18) රම්මලවක අධිකාරම් නර්තන කලාව සම්බන්ධව වැදගත් සාධකයක් ලෙස සැලකෙන්නේ

I. කංකාරි නැටීම සම්බන්ධව III. ජන කවි නිර්මාණය සම්බන්ධව
II. වන්නම් නිර්මාණය සම්බන්ධව IV. ගැමි නාටක සම්බන්ධව

19) මහනුවර යුගයේ කොහොඹා කංකාරිය පැවැත් වු බව සඳහන් කෘතිය ලෙස සැලකෙන්නේ

I. සිංහබා අස්න 111 චූල වංශය

II. දලදා සිරිත 1V මහා වංශය

20) කොළඹ යුගයේ නර්තන කලාව සම්බන්ධව වැදගත් සාධකයකි

I. වන්නම් නිර්මාණය III. රවින්ද්‍ර නාත් තාගෝර් තුමාගේ පැමිණීම
II. බලිශාන්ති කර්ම බිහිවීම IV. ශාන්ති කර්ම ආරම්භය

21) කැළණිය විශ්ව විද්‍යාලීය සෞන්දර්ය අධ්‍යන ආයතනය ස්වාධීන විශ්ව විද්‍යාලයක් බවට පත් වූයේ

I. 2010
II. 2005
III. 1974
IV. 2000

22) සොකරි නාටකයේ ප්‍රබලම චරිතය නිරූපනය අයත් චරිතය වන්නේ

I. ගුරුහාමි
II. පරයා
III. වෙදරාල
IV. සොකරි

23)"ආල වෙලා පිය සේ පටන් " මෙම කවි පදය කෝළම් නාටකයේ චරිතය ලෙස හඳුන්වන්නේ

I. ජසයා
II. මුදලි
III. ලෙංචිනා
IV. පුරන්සියා

24) කතකලි නර්තන දැනට ව්‍යවහාරයේ පවතින තත්ත්වයට පත් කල කවියා වුයේ,

I. රවින්ද්‍රනාත් තාගෝර්
II. භරතමුණි
III. වෙල්ලතෝල් නාරායන් මෙනන්
IV. රවිශංකර්

25) කතකලි නර්තන සඳහා වු මුල්ම අධ්‍යාපන ආයතනය වුයේ,

I. කලා මංඩලම
II. ශාන්ති නිකේතනය
III. විශ්ව භාරතී
IV. දිල්ලි විශ්ව විද්‍යාලය

26) සම්ප්‍රදායන් තුනේම ශාන්ති කර්මයන්හි කරනු ලබන ප්‍රධාන චාරිත්‍රයයි.

I. පිදේනි දීම
II. මරු සන්නිය
III. යක් ඇන්නුම නැටීම
IV. අඩවිදවන

27) පිලිවෙලින් උඩරට පහතරට හා සබරගමු යන නර්තන සම්ප්‍රදායන් තුනෙහිම නියමිත වන්නම් ප්‍රමාණය ලෙෂ සැලකෙන්නේ,

I. 18 , 20 , 24
II. 20 , 24 , 32
III. 18 , 24 , 32
IV. 18 , 18 , 32

28) දේශීය නර්තන සම්ප්‍රදායන් තුනටම පොදු වු ශාන්ති කර්මයකි.

I. සන්නි යකුම
II. දෙවොල් මඩුව
III. වලියක් මංගල්‍යය
IV. බලි ශාන්තිය

29) කතකලි නර්තනය සඳහා යොදා ගන්නා තාල වාද්‍ය භාන්ඩයකි.

I. කබ්ලාව
II. චෙන්ඩාව
III. මෘදාංගය
IV. ඩොල්කිය

30) ඉන්දියානු නර්තන සම්ප්‍රදායන් අතර ප්‍රබල වේශ නිරූපනයක් ඇති නර්තන සම්ප්‍රදාය වන්නේ,

I. භරත නාට්‍යයම්
II. කතකලි නර්තනය
III. කතක් නැටුම
IV. මනිපුරී නැටුම

31) අනුරාධපුර යුගයේ ස්තූප සම්බන්ධ කර නැටුම් ගැයුම් වැයුම් වලින් පූජා පැවැත් වු රජ ලෙද සැලකෙන්නේ,

I.පඩුවස් දෙව් රජු
II. භාතික අභය රජු
III. දුටු ගැමුණු රජු
IV. කාමන් තිස්ස රජු

32) පොලොන්නරු යුගයට අයත් නර්තන සාධකය කුමක්ද?

I. කුට්ටම් පොකුණේ නලගන රූපය
II. අංක 2 දරන ශිව දේවාලය
III. ලෝවා සහා පායේ කණු හිස්
IV. ඇම්බැක්කේ දේවාලය

33) අත්‍යා බෙර වාදනය සුවිශේෂි වන ශාන්තිකර්මය ලෙස සැලකෙන්නේ,

I. දෙවොල් මඩුව
II. කොහෙඹා කංකාරිය
III. සන්නි යකුම
IV. පහන් මඩුව

34) කොහොඹා කංකාරිය ශාන්ති කර්මයේ අන්තර්ගත නාට්‍යමය පෙළපාලි අංගයකි.

I. යක්කම්
II. දෙවොල් ගොඩ බැසීම
III. සන්නි යකුම
IV. පහන් මඩුව

35) පහත රට හා සබරගමු ශාන්තිකර්ම දෙකටම අයත් එකම උපන් කතාව සම්බන්ධ වන ශාන්තිකර්ම දෙකකි.

I. කොහොඹා කංකාරිය හා සන්නි යකුම
II. දෙවෙල් මඩුව හා පහන් මඩුව
III. සන්නි යකුම හා දෙවෙල් මඩුව
IV. බලි ශාන්තිකර්ම හා පහන් මඩුව

36) මාලක්කම් බඹර වළලු පතා විස්ස ආදී ශිල්ප ක්‍රම ඇතුලත් නර්තන සම්ප්‍රදාය වන්නේ,

I. උඩරට
II. පහතරට
III. සබරගමු
IV. ජන නැටුම්

37) මැදුම් තනි තිතට අයත් බෙර පදයකි.

I. දොං ජිංත ගත දොංත
II. ජිං ගත ගො ගො
III. දොං දොංගත ජිං තරිකිට
IV. දොම්කිට කිය දොම්

38) දෙවොල් මඩු ශාන්තිකර්මය පවත්වන්නේ,

I. දෙවියන් සඳහා
II. යකුන් සඳහා
III. ග්‍රහයන් සඳහා
IV. භූතයන් සඳහා

39) පහත රට නර්තනය සඳහා විශාල මෙහෙවරක් කල නර්තන ශිල්පියෙක්.

I. S . පණීභාරත
II. තින්න මෙල ගුණයා
III. k.S. ප්‍රනාන්දු
IV. රදැල්ලේ පොඩි මහත්තයා

40) පහත සඳහන් නාට්‍ය අතරින් මුද්‍ර නාට්‍යයක් ලෙස හැඳින්විය හැක්කේ,

I. කැළණි පාලම
II. බල්ලොන් එක්ක බෑ
III. මනමේ
IV. නල දමයන්ති

## II කොටස

★ ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න

1) නර්තන කලාවේ ඓතිහාසික පසුබිම පිළිබඳව මහනුවර යුගය ආශ්‍රයෙන් කරුණු 5 ක් ගෙන හැර දක්වන්න.

2) මාත්‍රා 2 + 4 තිත් රූපයට අයත් වන්නමක බෙර පදය ආශ්‍රයෙන් කරුණු 5 ක් ගෙන හැර දක්වන්න.

3) ගැමි නාටක නම් කර ඔබ කැමති ගැමි නාටකයක පවතින ප්‍රදේශ උපන් කතාව චරිත 5 ක් හා වාදනය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

4) උඩරට ශාන්ති කර්මයක චාරිත්‍ර 5 ක් නර්තන අංග 5 ක් හා වාදන භාණ්ඩය සඳහන් කරන්න.

5) දේශීය නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වු නර්තන ශිල්පීන් දෙදෙනෙකු හඳුන්වා එක් අයෙක් පිළිබඳ විස්තරයක් කරන්න.

6) කතකලි නර්තන සම්ප්‍රදාය පැවති ප්‍රදේශ, ආරම්භ වු ආකාරය, ආගමික පසුබිම හා සංගීත සම්ප්‍රදාය, හඳුන්වා දෙන්න.

7) කොළඹ යුගයේ නර්තන කලාව සම්බන්ධව අධ්‍යාපනික වශයෙන් වැදගත් වන සාධක 5 ක් සඳහන් කරන්න.